2025 ජනවාරි 24

# මාධ්‍ය නිවේදනය

## 2024 වසරේ ශ්‍රී ලංකාවේ ගුවන් සේවා කර්මාන්තයේ වර්ධනය

2024 දී ශ්‍රී ලංකා ගුවන් තොටුපළ මගී, ගුවන් යානා සහ භාණ්ඩ ප්‍රවාහනයේ වේගවත් වර්ධනයක් වාර්තා කර ඇත.

- මගී සංචලන මිලියන 8.88 (2023 වසරට සාපේක්ෂව 2024 වසරේ_වර්ධනය : 17.69%.)
- ගුවන් යානා සංචලන 56,289 (2023 වසරට සාපේක්ෂව 2024 වසරේ_වර්ධනය : 20.69%.)
- භාණ්ඩ ප්‍රවාහන මෙට්‍රික් ටොන් 192,498 (2023 වසරට සාපේක්ෂව 2024 වසරේ_වර්ධනය : 21.13%.)

ශ්‍රී ලංකාවට සැලකිය යුතු සන්ධිස්ථානයක් ලෙස, මෙරටට පැමිණීමේ ප්‍රධාන දොරටුව වන බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ (BIA), යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ (JIA) සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ (MRIA), ඇතුළු රටේ ගුවන්තොටුපළවල 2024 දී මගීන්ගේ පැමිණීමේ සහ පිටවීමේ සංචලනයේ වැඩිවීමක් වාර්තා කර ඇති අතර එය මිලියන 8.8 සීමාව ඉක්මවා ගොස් ඇත. **මෙම ගුවන් මගීන්ගේ වැඩිවීම ශ්‍රී ලංකාව කළාපය හා සම්බන්ධ කිරීමේ මෙන්ම** සංචාරක, වෙළඳාම සහ වාණිජ කටයුතු සඳහා පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකාවේ ගුවන් සේවා යටිතල පහසුකම් ඉටු කරන වැදගත් කාර්යභාරය ඉස්මතු කරයි.

මගී සංචලන වැඩිවීමට හේතු වී ඇත්තේ ගුවන් සේවා කර්මාන්තය පුළුල් කිරීම සහ සංචාරක ව්‍යාපාරය නංවාලීම අරමුණු කරගත් උපායමාර්ගික ක්‍රියාකාරකම් ඇතුළු සාධක වන අතර මෙමගින් සංචාරකයින් මෙරටට පැමිණීම වැඩි කිරීමෙන් ජාතියේ ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.

2024 දී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, Emirates, Qatar Airways ,Singapore Airlines, Etihad Airways, Air India, Indigo, Turkish Airlines ගුවන් සේවය වැනි ප්‍රධාන ජාත්‍යන්තර ගුවන් සමාගම් ඇතුළුව ගුවන් සමාගම් 30 කට වැඩි ගණනකට සේවය ලබා දී ඇති අතර, ඊට අමතරව ජාතික ගුවන් සේවය වන ශ්‍රී ලංකන් ගුවන් සමාගමටද සේවය ලබා දී ඇත. Skytrax's ශ්‍රේණිගත කිරීම්වලට අනුව, 2024 දී Skytrax's හි ලොව හොඳම ගුවන් සේවා 10 න් හයක් ශ්‍රී ලංකාවට ගුවන් ගමන් ක්‍රියාත්මක වූ අතර ඒවානම් Qatar Airways ,Singapore Airlines, Emirates, Cathay Pacific Airways, Turkish Airlines and Swiss International Air Lines ගුවන් සේවයන් වේ. (මූලාශ්‍රයඃ ලොව හොඳම ගුවන් සේවා 100 2024 Skytrax's).

Etihad Airways, Qutar Airways , Indigo, Turkish Airways ,Air China වැනි ගුවන් සමාගම් කිහිපයක් ශ්‍රී ලංකාවට ඔවුන්ගේ ගුවන් ගමන් වාර ගණන වැඩි කර ඇත. ඊට අමතරව, Thai Airways , Chongqing Airways, Aeroflot, Cathay Pacific Airways යනාදිය ගුවන් සමාගම් 2024 දී කොළඹට නියමිත මගී ගුවන් ගමන් නැවත ආරම්භ කර ඇත. Enter Air, Edelweiss, Azur Air, Sky up, Air Astana, වැනි ගුවන් සමාගම් සෘතුමය Charter Flight කිහිපයක් ශ්‍රී ලංකාවට ගුවන් ගමන් මෙහෙයුම් නැවත ආරම්භ කළ අතර එමගින් රටට වැඩි සංචාරකයින් ප්‍රමාණයක් පැමිණ ඇත.

Red-Wings ගුවන් සේවය 2024 ඔක්තෝබර් මාසයේදී මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ දක්වා ගුවන් මෙහෙයුම් නැවත ආරම්භ ආරම්භ කර අතර Indigo ගුවන් සේවය 2024 සැප්තැම්බර් 01 වන දින යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළට ගුවන් මෙහෙයුම් ආරම්භ කරන ලදී.

ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම, ගුවන් සේවා හවුල්කරුවන් සහ අනෙකුත් කොටස්කරුවන් සමඟ ඉහළම මට්ටමේ සේවාවන් සැපයීමට සහ මිලියන සංඛ්‍යාත මගීන්ට බාධාවකින් තොරව ගුවන් ගමන් අත්දැකීමක් සහතික කිරීම සඳහා ඉහළම මට්ටමේ ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව පවත්වා ගැනීමට කැපවීමෙන් කටයුතු කරමින් සිටී.

ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ (AASL) සභාපති, එයාර් චීෆ් මාර්ෂල් හර්ෂ අබේවික්‍රම (විශ්‍රාමික) මහතා පවසන ආකාරයට :

"ශ්‍රී ලංකාව ආසියා-පැසිෆික් කලාපයේ ප්‍රධාන ගුවන් සේවා මධ්‍යස්ථානයක් ලෙස අඛණ්ඩව ස්ථානගත වී සිටී. මෙම සන්ධිස්ථාන රටේ ගුවන් සේවා කර්මාන්තයේ අනාගත වර්ධනය සහ සංවර්ධනය සඳහා ඇති අතිමහත් විභවය පෙන්නුම් කරයි. මිලියන 8.8 කට අධික මගී සංචලනයක් ළඟා කර ගැනීම, ශ්‍රී ලංකාවේ ගුවන් සේවා අංශයේ ශක්තිය හා හැකියාව පිළිබඳ සාක්ෂියක් වන අතර රජයේ සංචාරක ඉලක්ක සපුරා ගැනීම සඳහා අඛණ්ඩ ප්‍රගතිය පිළිබඳ පොරොන්දු දර්ශකයක් ලෙස සේවය කරයි. අපගේ වටිනා ජාත්‍යන්තර ගුවන් සේවා හවුල්කරුවන්, සංචාරක හවුල්කරුවන් සහ අනෙකුත් සියලුම කොටස්කරුවන් ශ්‍රී ලංකාවේ ගුවන් සේවා සහ සංචාරක ක්ෂේත්‍රයට දක්වන දායකත්වය ගැන අපි සතුටු වන අතර ඔවුන්ගේ සුවිශේෂී සහයෝගය වෙනුවෙන් ඔවුන්ට අපගේ හෘදයාංගම කෘතඥතාව පළකරන්නෙමු. ගුවන් සේවා කර්මාන්තයේ අනාගත අභිවෘද්ධිය උදෙසා ගුවන් සේවා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම දැඩි ලෙස කැපවීමෙන් කටයුතු කරයි. 2 වන පර්යන්ත ව්‍යාපෘතිය සඳහා අපි දැනටමත් ටෙන්ඩර් කැඳවා 2025 සැප්තැම්බර් මාසයේදී එහි ඉදිකිරීම් ආරම්භ කිරීමට සැලසුම් කර ඇති අතර 2028 මාර්තු මස වන විට නිම කිරීමට ඉලක්ක කර ඇත."

**ආචාර්ය සුමිත් ද සිල්වා**
ප්‍රධානී, අලෙවිකරණ සහ ආයතනික සන්නිවේදන අංශය,
ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම,
දෙවන මහල, පර්යන්ත ගොඩනැගිල්ල,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ (BIA),
ශ්‍රී ලංකාව.